07. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 600/-කි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ නිල ගිණුම වන ලංකා බැංකුවේ බොරැල්ල අධිශ්‍රේණි ශාඛාවේ අංක 7041491 දරන ගිණුමට දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත මුදල් ගෙවා අයදුම්කරු නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

**ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර,**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා. ආ.).

2026 ජූලි මස 21 වැනි දින.

07 - 437

---

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය (III ශ්‍රේණිය) රියදුරු (දෙපාර්තමේන්තුගත) හ ගිලන්රථ රියදුරු තනතුරු සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ඉහත විභාගයේ අයදුම්පත් කැඳවීම සඳහා 2026.07.17 දින රජය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ 07 වන වගන්තිය පෑ පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.